# බයිස්කෝප්

''අන්න ඩගුඩුගු කරත්තෙ එනෝ.'' සෝමපාල අයියා ගල්වළ පැත්තේ සිට මහපාරට දුවගෙන ආවේ ශබ්ද නගා කෑ ගසාගෙන අපටත් පණිවිඩය දී ගෙන ම ය. ගුණපාල මල්ලී, සිරිපාල මල්ලී, රංජි, කමලා, ඥානා ඇතුළු අප සියලු දෙනා පාරට දුවගෙන ගියේ ඩගුඩුගු කරත්තය ගෙන එන පණිවිඩය දැන ගැනීමට වඩා බෙදා හරිනු ලබන දැන්වීම් කොළය බැගින් ඉල්ලා ගැනීම අපගේ සෙල්ලමක් වී තිබීම නිසා ය. කරල්දැක්කුවේ රාළහාමිලාගේ ගෙදර ළඟ කන්දෙන් මතු වී එන ගොන් බැඳි කරත්තයකි. තප්පු ශබ්ද නගමින් ඉදිරියට එන කරත්තය අප අසලට එනතුරු ඉවසා සිටින්නට අපට බැරි ය.

අපි සියලු දෙනා ම ''කොළයාක්. කොළයා...ක්, කොළයා.....ක් යනුවෙන් කෑ ගසමින් තරඟයට දුවගෙන කරත්තය ඉදිරියට ගියෙමු. කරත්තයේ බැඳ සිටින උල් උස අං දෙකක් සහ මොල්ලියක් ඇති සුදු පාට ගොනා බෙල්ලේ බැඳ ඇති ගෙජ්ජි සොලවමින් මහා ආඩම්බරයෙන් ලතාවකට ඉදිරියට එන විලාසයක් පෙන්නුම් කරයි. ඌ හිස හරවන්නේත් පා හසුරුවන්නේත් තප්පු ශබ්දයට අනුව විය යුතු ය. කරත්තය ඉදිරියට ගිය අපි කරත්තය පිටුපසින් අල්ලාගෙන එයත් සමග ම ඉදිරියට ආවෙමු. කරත්තයේ දෙපස අලවන ලද දැන්වීම පොල්ගෙඩි අකුරෙන් ලියා ඇත. ''දැන් පෙන්වනවා - දැන් පෙන්වනවා සිනමාස්ගේ මනුෂ්‍යත්වය 6.30 ට 9.30ට - නිවි ඉම්පීරියල් ටෝකීස් අතුර. සිම්පංචියාගේ අපූරු සෙල්ලම් නරඹන්න. එන්න. බලන්න. ප්‍රීතිවන්න.''

කරත්තය ඇතුළේ තප්පුවක් තබාගෙන කිසියම් වූ තාලයකට වාදනය කරන කෙනෙකි. තවකෙක් අතේ කොළ මිටියක් තබාගෙන ඒවා පාරට විසි කරන්නේ යන එනවුනට අහුලා ගැනීමට ය. අපි ''කොළයක් කොළයා..ක්'' කියමින් දැන්වීම් කොළ ඉල්ලා පොරකෑවෙමු. අපේ ඉස්කෝලේ ළමයකු වන රංජිත් දයාරත්නලාගේ තාත්තා වන ජාලිස් උන්නැහේගේ නිවිසිටි මුද්‍රණාලයේ අච්චු ගස්සන ලද පුංචි ප්‍රමාණයේ දැන්වීමකි. එහි ''දැන් පෙන්වන'' බයිස්කෝප් එක පිළිබඳව විස්තර සඳහන් කර ඇත. එහි චිත්‍රපට කතාවෙහි පුංචි සාරාංශයක් දක්වා ''ඉතිරිය චිත්‍රපටියෙන් බලා ගන්න.'' යනුවෙන් සඳහන් කර ඇත. අපට ද කොළ බෙදමින් යන කරත්තය පිටුපසින් අප ද ඊළඟ වංගුව තෙක් ගමන් ගත්තේ ද තප්පුවේ ශබ්දය අනුකරණය කරමින් ම ය. මෙම කරත්තය මගින් කරනු ලබන්නේ, අද ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පිහිටා ඇති අතුර කඩමණ්ඩිය අසල, අම්බලම තිබුණු හිස් බිමෙහි තාවකාලිකව සාදා ඇති විශාල කූඩාරමෙහි පෙන්වනු ලබන චිත්‍රපටය පිළිබඳ ප්‍රචාරය යි. මෙම ප්‍රචාරණය කරත්තවලින් තප්පු ගසමින් පමණක් නොව සමහර දිනවල කාර්වලින් ද සිදු කරනු ලබයි. කාර් රථය තුළ මෙවැනි ම තප්පු ශබ්දයක් නගමින්, දැන්වීම් පත්‍රිකා බෙදමින් පරගොඩ පැත්තට යන අවස්ථා ද බොහෝ ය. සමහර දිනක කාර් රථයේ ශබ්ද විකාශන යන්ත්‍රයකින් ද මෙම ප්‍රචාරණ කාර්යය සිදු කරයි. මෙම ප්‍රචාරණය කලවැල්ලාව, ගලහේන, ඇගල්ඔය, බෝතලේගම, තිබ්බොට්ටාව, යටගම්පිටිය, පරගොඩ ආදි ගම්වල සහ පළාත ආශ්‍රිතව ඇති වතුවල ද කරනු ලබයි.

''ටෙන්ට්'' යනුවෙන් ලොකු කුඩා සැමදෙන වහරණු ලබන විශාල කූඩාරම ඇතුළේ චිත්‍රපට පෙන්වයි. ඉතා උස යකඩ කණු දෙකක් ඈතට වන්නට සිටුවා විශාල, ඝණකම කාකි රෙද්දක් භාවිතා කොට ටෙන්ට් එක සකස් කොට ඇත. එම කණු දෙක මුදුනේ සිට පහත්වන ලෙස දෙපසට ඈතට වන්නට ඇද ඇති කූඩාරම් රෙද්ද මිනිසකුගේ උස ප්‍රමාණයෙන් නවතා ඉතිරිය පහළට එල්ලීමට සලස්වා ඇත. කූඩාරම සම්පූර්ණ කළ විට එළියේ සිට ඇතුළවත්, ඇතුළ සිට එළියවත් පෙනෙන්නේ නැත. චිත්‍රපට පෙන්වන සුදුපාට මහා තිරය කූඩාරම තුළ ඉදිරියෙහි රැළි නොවැටෙන්නට එල්ලා ඇත. තිරයට තරමක් නුදුරේ සිට පොල් කොට සිටුවා ඒ මත ලෑලිවලින් බංකු පේළි කීපයක් ගසා ඇත.




බංකුවලට පිටු පසින් පුටු රාශියක් පේළිවලට තබා තිබේ. මෙම පුටු දිග හැරීමට මෙන් ම හැකිළීමට හැකි ලෙස තනා ඇත. නරඹන්නෝ මෙම බංකු සහ පුටුවල සිට චිත්‍රපට බැලිය යුතු වේ. ටිකට් විකිණීම සඳහා එළියේ ලෑලි කුටි දෙකක් සාදා ඇත. එක කුටියක් ''බංකුවට'' ටිකට් අලෙවි කිරීම සඳහා ය. අනෙක ''පුටුවට'' ටිකට් අලෙවි කිරීම සඳහා ය. එම කුටි ළඟට තරමක් දුර සිට ලෑලි පටි ගැසූ පෝලිම ය. කුටියේ සිට ඇතුල්වීමේ දොරටුව දක්වා ද පෝලිම සාදා ඇත. එවකට බංකුව සඳහා ලොකු කෙනෙකුට අය කරනු ලබන්නේ සත පනස්පහකි. භාගය සත තිහකි. පුටුව සඳහා ලොකු කෙනෙකුට රුපියල් එකයි සත දහයකි. පුංචි ටිකට් පත කොටස් දෙකක් වන සේ මැදින් තිත් ඉරකින් වෙන්කොට ඇත්තේ දොරටුවේ දී එක කැබැල්ලක් කඩා ගෙන අනෙක් කැබැල්ල නරඹන්නාට දීම සඳහා ය.




සිංහල, දෙමළ සහ හින්දි චිත්‍රපට මෙහි වරින්වර පෙන්වූ අතර චිත්‍රපට බැලීම සඳහා විශාල පිරිසක් සවස හය පමණ වන විට අතුරට එක්රොක් වනුයේ අහල පහළ මෙන් ම තරමක් ඈත සිට ය. පරගොඩ, යටගම්පිටිය, නිග්ගහ, කලවැල්ලාව, මහගම, ගලහේන, බුලත්සිංහල, ඇගල්ඔය, මාරහේන වත්ත ආදී පෙදෙස්වලින් එන පිරිස චිත්‍රපටය බලා ආපසු යන්නේ පයින් ය. චිත්‍රපට අවසන් වන විට ප්‍රවහණ පහසුකම් නොතිබිණි.

දුප්පතාගේ දුක, අයියයි මල්ලියි, වීරපුතා, වනමෝහිනි, මනුෂ්‍යත්වය, අංජලී, නාඩෝඩි මන්නන්, ගුලේබකාවලී, ආදී එවකට පෙන්වූ චිත්‍රපටවල නම් කීපයක් පමණක් මතක් කළ හැකි ය.

''උඹටත් ඔන්නං බයිස්කෝප් බලල වරෙන් මාමලත් එක්ක ගිහිල්ල'' බොහෝ කලක් තිස්සේ මගේ හිතේ පැවති ආසාව ඉටු වූයේ අම්මාගේ මේ වදන් තුළිනි. කඩල කෑමට යයි සත පහක් ද ගුණපාල මල්ලීට සහ මට ටිකට් ගැනීම සඳහා සත හැටක් ද අම්මා මා අත තැබුවේ''මේක නැති කර ගන් නැතිව මාම අතට දීපන්'' කියමින් ය.

එදා මහතුන් මාමාත්, නැන්දාත්, ගුණපාල මල්ලීත්, සෝමපාල අයියාත්, මාත් ඇතුළුව තවත් කීප දෙනෙක් ම චිත්‍රපට බැලීම සඳහා අතුරට ගියේ පයින් ම ය. මහතුන් මාමාත්, නැන්දාත් පුටුවට ටිකට් ගත් අතර ගුණපාල මල්ලීටත් මටත්, සෝමපාල අයියාටත් ටිකට් ගත්තේ බංකුවට බාගේ ඒවා ය. නාමාවලිය වැටී චිත්‍රපටය රඟ දැක්වෙන ආකාරය දෙස අප බලා සිටියේ පුදුමයෙනි. මේ කූඩාරම ඇතුළේ මහා විශාල මිනිසුන් ඇවිද යන්නේ, වාහන ආදිය යන්නේ එන්නේ කොහොමද යන්න අපට විස්මය ගෙනදුන් කාරණයක් විය. ''සේතං අයියගෙ හෝටලයේ - කෑමට බීමට ගුණයි රසයි'' යන සිංදුව තිබුණේ එම චිත්‍රපටයේ යයි යන්තම් මතකයක් ඇත. නම ''දුප්පතාගේ දුක'' ය. චිත්‍රපටය මැද දී දෙන ලද විවේකයේ දී අත තිබූ සත පහට රටකජු මුලක් මිල දී ගෙන අපි තුන්දෙනා බෙදාගෙන පොතු ඇර කෑවෙමු. විටෙක උරුහම් බාමින් ද, ෆයිට් එකක් අවසානයේ අත්පුඩි නගමින් ද, විසිල් කරමින් ද, විකට ජවනිකා පවතින විට මහා හයියෙන් හිනා වෙමින් ද, දුෂ්ටයා හට කේන්තියෙන් බණිමින්ද, සමරහ විටක දී නොයෙකුත් අසැබි වචන කියමින් ද, එක එක තරාතිරමේ රසික පිරිස චිත්‍රපට නැරඹූ ආකාරය මතකයේ රැඳී ඇත. ඉතාමත් ආශාවෙන් ප්‍රබෝධයෙන් යුතුව ''දුප්පතාගේ දුක'' නරඹා අවසානයේ නිවෙස්වලට ගියේ ඉටි පන්දමක් පත්තුකර පොල්කටුවකට මුවා කරගෙන පරගොඩ පාරේ පොලීසිය අසලින් ය. චිත්‍රපටයේ සමහර දෙබස් උච්චාරණය කරමින් චිත්‍රපටයේ සින්දු කියමින්, විහිළු කරමින් අප නිවෙස්වලට ගොඩ වූයේ ද බොහෝ ප්‍රසන්න සිතුවිලිවලින් යුතුව ය.

**බොහෝ තරුණ සහ ළමා පිරිස චිත්‍රපට බලන්නට යන්නේ "ෆයිට්" බැලීමට ය. කඩු ෆයිට් ඇති රජකතා චිත්‍රපට බැලීමට බොහෝ අය කැමති ය.**

බොහෝ තරුණ සහ ළමා පිරිස චිත්‍රපට බලන්නට යන්නේ ''ෆයිට්'' බැලීමට ය. කඩු ෆයිට් ඇති රජකතා චිත්‍රපට බැලීමට බොහෝ අය කැමති ය. ජනප්‍රිය චිත්‍රපට සඳහා ටෙන්ට් එකේ පුටු සහ බංකුවල පමණක් නොව ඒවා දෙපස සිට ද ඉතා උද්යෝගයෙන් උනන්දුවෙන් බලා සිටින අයගෙන් පිරී යයි. එවකට වර්ණ චිත්‍රපට තිබුණේ ම නැත. සියල්ල ''කළුසුදු'' ය. ඊස්ට්මන් වර්ණ යනුවෙන් පැවති චිත්‍රපට ඉඳහිට පෙන් වූ නමුදු ඒවා දම් පැහැයට හුරු එක් පැහැයකින් යුතු විය. ලංකාවේ වෛවර්ණ චිත්‍රපට මුලින් ම නිෂ්පාදනය කරනු ලැබුවේ එක්දහස් නවසිය හැට ගණන් වල දී ය. ඒ රන්මුතු දූව නම් චිත්‍රපටයෙනි.

තමා උපයන සියලු මුදල් චිත්‍රපට සඳහා වැය කරන තරුණ මෙන් ම වැඩිහිටි පිරිස ද සිටියහ. පික්චර් පිස්සුව හැදී තිබුණු සමහර කොලු ගැටව් මග යන එන විට ද චිත්‍රපට කොටස් රඟපාමින් ද, කෝටුකෑලි අතට ගෙන ''කඩුෆයිට්'' කරමින් ද යනු දැක ගත හැකි වන අවස්ථා ද අඩුවක් නොවිණි.

මෙවන් ''ටෙන්ට්'' ටික කාලයක දී ගලවාගෙන වෙනත් ගම්බද ප්‍රදේශයක සවි කිරීම සඳහා රැගෙන යනු ලැබේ. තද වර්ෂාව පවතින විට මෙම ටෙන්ට් ඇතුළත තෙමෙන අවස්ථා ද, වතුර පහරවල් ඇතුළට ගලා එන අවස්ථා ද තිබිණි. එමෙන් ම බංකු සහ පුටු මකුණන්ගේ පාරාදීස බවට පත්ව තිබුණි.

වරින් වර ගම්සභා භූමියේ පමණක් නොව මාරගස් දෙක ළඟ පැවති ක්ලබ් එක අසල පිටියේ ද ටෙන්ට් සවි කොට චිත්‍රපට පෙන්වූවා මට මතක ය. 'මාරගස්දෙක' යනු බුලත්සිංහල රෝහලට හැරෙන හන්දියේ දෙපස තිබූ ප්‍රමාණයෙන් සුවිශාල වූ මාරගස් දෙක ය. අතු විහිදී ගස් දෙකේ ම අතු එක් වී පාරට ලබා දුන්නේ විශාල සෙවණකි. නගරයට ආලෝකයක් වූ මෙම මාරගස් දෙක පසු කලක දී කපා හෙළීම පිළිබඳව මට ඇති වන්නේ කිට්ටු ඥාතියකු අහිමි වූවා වැනි හැඟීමකි.

**මතු සම්බන්ධයි**